03/2018

MR 5

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය සඳහා පාසල් පාදක සායනික අධීක්ෂණ ක්‍රියාවලියක අවශ්‍යතාව, එවැනි අධීක්ෂණ ක්‍රියාවලියක් සැලසුම් කිරීම සහ එය අත්හදා බැලීම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්.

(කොළඹ දිස්ත්‍රික්කයේ තෝරාගත් 1 ඒබී, 1 සී සහ 2 වර්ගයේ පාසල් වල කනිෂ්ඨ ද්විතීයික හා ද්විතීයික ශ්‍රේණි (7 - 11 ශ්‍රේණි) ආශ්‍රයෙන්)

මහඑගොඩගේ චන්ද්‍රසිරි පෙරේරා

(B.A., Diplima in Education (Merit), National Diploma in Teaching (Distinction), M.Ed.)

UNIVERSITY OF COLOMBO SRI LANKA
26 OCT 2004
LIBRARY

අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කරන අධ්‍යාපනික පර්යේෂණ නිබන්ධනය,

අධ්‍යාපන පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය.

UCLIB
518080

University of Colombo
Library
Sri Lanka

2003 මාර්තු

## අධ්‍යයන සාරාංශය

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සංවර්ධනය උදෙසා සායනික අධීක්ෂණ ක්‍රියාවලියක අවශ්‍යතාවය විමසීම සහ එවැනි අධීක්ෂණ ක්‍රියාවලියක් සැලසුම් කර අත්හදා බැලීම පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක් මෙහිදී සිදු විය. පංති කාමර උපදේශාත්මක අධීක්ෂණ ව්‍යවහාරයන් සංවර්ධනය කර ගත යුතු තත්වයක පවත්නා බවට අනාවරණයන් රාශියක් හඳුනාගත හැකි වූ අවධියක එම අධීක්ෂණ ව්‍යවහාරයන් හි ගුණාත්මක සංවර්ධනයක් සායනික අධීක්ෂණය තුලින් ළගා කර ගැනීමේ හැකියාව ප්‍රධාන අරමුණු 5 ක් ආශ්‍රයෙන් සලකා බලන ලදී. එම අරමුණු නම් වර්තමාන පාසල් පාදක අධීක්ෂණ ක්‍රියාවලියේ ක්‍රියාකාරී ස්වභාවය විමසීම, සායනික අධීක්ෂණය ආශ්‍රිත න්‍යායාත්මක ප්‍රවේශය විමසීම, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සංවර්ධනය සඳහා සායනික අධීක්ෂණයේ අවශ්‍යතාවය විමසීම, සායනික අධීක්ෂණ ක්‍රියාවලියක් සැලසුම් කිරීම සහ එම ක්‍රියාවලිය අත්හදා බැලීම හා එහි සාර්ථක අසාර්ථක බව විමසා බැලීම යන ඒවාය.

කොළඹ දිස්ත්‍රික්කයෙන් ස්ථරගත අහඹු නියැදිම මගින් තෝරාගත් පාසල් 27 ක ගුරුභවතුන් හා අභ්‍යන්තර අධීක්ෂකවරුන් 263 දෙනෙකුගේ නියැදියකින් ප්‍රශ්නාවලී හා සම්මුඛ සාකච්ඡා ආශ්‍රයෙන් ද අභ්‍යන්තර අධීක්ෂණ අවස්ථා 10 ක් නිරීක්ෂණයෙන් ද දත්ත රැස් කළ අතර පාසල් 3 ක පර්යේෂකයා විසින් සැලසුම් කළ පෙර සාකච්ඡාව (Pre-conference) (P) නිරීක්ෂණය (Observation) (O) විශ්ලේෂණය Analysis (A) සහ පසු සාකච්ඡාව (Post-conference) (P) යන POAP ලෙස හැඳින් වූ අවස්ථා 4 කින් යුත් සායනික අධීක්ෂණ ක්‍රියාවලීන් 3 ක් දියත් කර ඒවා ඇගයීමට ලක් කිරීම ද කරන ලදී. එම අධ්‍යයනය ආශ්‍රයෙන් නිගමන කීපයකට එළඹිය හැකි විය.

පොදුවේ ගත් කල අභ්‍යන්තර අධීක්ෂණය පිළිබඳව යහපත් ගුරු ආකල්පයක් නැත. 2 වර්ගයේ පාසල් වල ගුරුවරු ඊට සාපේක්ෂව අඩු සැලකිල්ල දක්වති. බහුතර ගුරු පිරිසකගේ අදහස අභ්‍යන්තර අධීක්ෂකයින් නිසි පරිදි කටයුතු නොකරන බවයි. අධීක්ෂණය තුළින් සංවර්ධනය වීමට ගුරුවරු කැමති වෙති. අධීක්ෂණය පිළිබඳව අධීක්ෂකවරු අතර සංගත බවක් නැත. ගුරු අධීක්ෂක දෙපිරිසටම අධීක්ෂණය පිළිබඳ අඩු නිපුණතා ඇත. අභ්‍යන්තර අධීක්ෂකවරු තම අධීක්ෂණ කටයුතු ගැන සතුටු නොවෙති. විෂය ප්‍රධානීන් හා අංශ ප්‍රධානීන් අධීක්ෂණය සඳහා මනාව සංවර්ධනය කර ගත හැකි පිරිසකි. ගුරුවරු මෙන්ම අධීක්ෂකවරු ද සායනික අධීක්ෂණ ක්‍රියාවලියක අන්තර්ගතය යහපත් බවට සංජානනය කරති. එහෙත් ඒ පිළිබඳ පවත්නා නිපුණතා ප්‍රමාණවත් නැත. අත්හදා බලන ලද POAP සායනික අධීක්ෂණ ක්‍රියාවලිය තුළින් ගුරු සංවර්ධනයට හේතුවූ ක්‍රියාකාරකම් මාලාවක් හඳුනාගත හැකි විය. එහි දී කාලය පිළිබඳ ගැටළුවක් ඇති විය. පූර්ව හා පසු සාකච්ඡා අවස්ථා ඒකාබද්ධ වීමෙන් POAPOAPOA…… ලෙස සායනික අධීක්ෂණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ හැකියාව පවතී. මෙම නිගමන ආශ්‍රයෙන් යෝජනා කීපයක් ඉදිරිපත් කල හැකිය. සායනික අධීක්ෂණය ආශ්‍රිතව අධ්‍යාපන පද්ධතිය තුළ සියලුම දෙනාගේ නිපුණතා සංවර්ධනයට පියවර ගැනීම. ඒ ආශ්‍රිත පත පොත හා පර්යේෂණයන් ව්‍යාප්ත කල යුතු වේ. දැනට පාසල් වල හඳුන්වා දී ඇති ගුරු කාර්ය සාධන ඇගයීම ආශ්‍රයෙන් සායනික අධීක්ෂණය ව්‍යාප්ත කිරීම. ප්‍රමිතිකරණයට අනුව පාසල් කළමනාකරණය සැලසුම් කිරීමට සායනික අධීක්ෂණය යොදා ගැනීම. සායනික අධීක්ෂණ ක්‍රියාවලීන් පිළිබඳව විධිමත්ව වාර්තා කිරීම සඳහා POAP ආකෘති 6 නම්‍ය ස්වභාවයකින් සැලසුම් කිරීම. සෑම උපදේශාත්මක අධීක්ෂණ ක්‍රියාවලියක්ම සායනික මානයකින් දියත් කිරීමට පියවර ගැනීම.

University of Colombo, Sri Lanka